# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## දයා සරණ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

**දයා සරණ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය විසින් 2016 ජනවාරි මස 26 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 දෙසැම්බර් මස 07 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[70 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 11.00 යි** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# දයා සරණ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

## දයා සරණ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

"දයා සරණ සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුව, එකී පදනමට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක දරන "දයා සරණ සංවර්ධන පදනම" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

දයා සරණ සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු ව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "දයා සරණ සංවර්ධන පදනමේ" දැනට සාමාජිකයන් සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "දයා සරණ සංවර්ධන පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

පදනමේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ආගමික, සංස්කෘතික, අධ්‍යාපනික සහ ආර්ථික අන්තර් ක්‍රියාකාරීත්වය තුළින් ප්‍රදේශයේ තරුණ ප්‍රජාව අතර, ආගමික සහජීවනය, අන්‍යෝන්‍ය අවබෝධය. අධ්‍යාත්මික, සංවර්ධනය හොඳහිත සහ මිත්‍රත්වය වැඩිදියුණු කිරීම;

(ආ) ප්‍රදේශයේ ජනයාගේ සුභසාධනය, යහපත, සුරක්ෂිතභාවය, ඒකාග්‍රතාව සහ සමාජ තත්ත්වය ආරක්ෂා කිරීම, ඒ සඳහා තත්ත්වය ආරක්ෂා කිරීම, ඒ සඳහා සහාය වීම සහ ඒ පිළිබඳ සහතික වීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද ආරක්ෂා කිරීම ;

(ඇ) ක්‍රීඩා සහ ශාරීරික පුහුණු අභ්‍යාස ශාලා ඇතුළුව තරුණ සංවර්ධන මධ්‍යස්ථාන තුළින් නව යෞවන යෞවනියන්ගේ භෞතික සුභසාධනය සහ පුද්ගල සංවර්ධනය ඇති කිරීම ;

(ඈ) රැකියා අවස්ථා සොයා ගැනීම සඳහා ඉවහල් වන තරගකාරිත්වයට මුහුණ දීම සහ අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා ඔවුන්ගේ පුද්ගල සංවර්ධන මට්ටම් වැඩි දියුණු කරන්නා වූ විවිධ ක්ෂේත්‍රවල අවශ්‍ය පුහුණුව ලබා දීම මගින් අතිරේක අධ්‍යාපනය සඳහා සහයෝගය ලබා දීම;

(ඉ) යෝග්‍ය රැකියා අවස්ථා උදාකර ගැනීම සඳහා තරුණ ප්‍රජාව යොමුකර ගැනීමේ ඒකායන පරමාර්ථය ඇතිව ඔවුන්ගේ කුසලතා වර්ධනය කර ගැනීම සඳහා තරුණ ප්‍රජාව වෙනුවෙන් සාමයික තාක්ෂණික පුහුණු කඳවුරු පැවැත්වීම ;

(ඊ) වෘත්තියක් සඳහා තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ අදහස ඇතිව වඩු කර්මාන්ත, පෙදරේරු ශිල්පය හෝ වෙනත් සුදුසු වෘත්තීය පුහුණු පාසල් ප්‍රධාන නගර තුළ ස්ථාපනය කිරීම ;

(උ) මෝටර් රථ වාහන අලුත්වැඩියා කිරීමේ කර්මාන්තය පිළිබඳ තරුණ ප්‍රජාව පුහුණු කිරීම සඳහා ප්‍රදේශය තුළ මෝටර් යාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථාන (ගරාජ) ස්ථාපනය කිරීම සහ එම කර්මාන්තයේ නියැලෙන වෘත්තිකයින් විසින් මෙහෙයවනු ලබන සාමයික දේශන මාලාවක් සංවිධානය කිරීම ;

(ඐ) ප්‍රදේශයේ සිටින යෝග්‍ය තරුණ ප්‍රජාවගේ අයදුම්පත් සඳහා පහසුකම් සැපයීම පිණිස මධ්‍යම රජය යටතේ ඇති විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග සම්බන්ධීකරණයක් ඇති කිරීම සහ යෝග්‍ය විදේශ රැකියා අවස්ථා සඳහා ඔවුන්ව නිර්දේශ කිරීම ;

(එ) රැකියා අවස්ථා උදා කර ගැනීම සඳහා වූ අවශ්‍යතාවක් වන ජාත්‍යන්තර භාෂාව (ඉංග්‍රීසි) පිළිබඳ දැණුම සහ එම භාෂාව කථා කිරීමේ හැකියාව ග්‍රාමීය තරුණ ප්‍රජාව වෙත ලබාදීම සඳහා සන්ධ්‍යා සහ සති අන්ත පන්ති පැවැත්වීම ;

(ඒ) තරුණ ප්‍රජාවගේ අධ්‍යාපන මට්ටම්, හැකියාවන් සහ පළපුරුද්දට සරිලන පරිදි සුදුසු රැකියා අවස්ථා සොයා ගැනීම සඳහා ප්‍රදේශයේ තරුණ ප්‍රජාවගේ තොරතුරු සමග ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ තොරතුරු රැස්කරන්නා වූ රැකියා බැංකුවක් පිහිටුවීම ;

(ඔ) තරුණ ප්‍රජාව දිරිමත් කිරීම, ඔවුන්ට උපදෙස් සහ ආධාර මෙන්ම මුල්‍යමය සහායන් ද ලබාදීම සහ නොඑසේනම් ඔවුන්ට ස්වයං රැකියාවක නියුක්තවීම සඳහා අවශ්‍ය පුද්ගල කුසලතා වර්ධනය කිරීම සහ එසේ ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ නිෂ්පාදන අලෙවිය සඳහා වෙළඳපොළ ද සොයාදීම ;

(ඕ) කෘෂිකර්මය, කර්මාන්ත, තාක්ෂණය මෙන්ම වෙනත් ඊට සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳ කාර්ය සාධන අධ්‍යයන සිදු කිරීම සහ ප්‍රදේශයේ ජනතාවගේ සාමාන්‍ය ආර්ථිකය සහ සමාජ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම ;

(ක) තරුණ ප්‍රජාවගේ ජීවන මට්ටම නඟා සිටුවීමේ අරමුණ ඇතිව ස්වයං රැකියාවක් ලෙස ගෘහ කර්මාන්ත ආරම්භ කිරීම සහ පවත්වා ගැනීම සඳහා තරුණ ප්‍රජාව වෙත ආධාර සහ සහාය ලබාදීම ; සහ

(ග) ප්‍රදේශය තුළ කෘෂිකාර්මික සහ කාර්මික ව්‍යාපෘති දියත් කිරීම සහ ඒවා සංවර්ධනය කිරීම සඳහා තරුණ ප්‍රජාව වෙත කෘෂිකාර්මික උපකරණ සහ යන්ත්‍රසූත්‍ර ලබා දීම ;

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් එක් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය ක්‍රියා සහ කාරණා කිරීමට, ඉටු කිරීම සහ ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය :—

(අ) ලියාපදිංචි වීමට, සංස්ථාපනය කිරීමට හෝ අන්‍ය ආකාරයකින් බලය පවරාදීම හෝ නියෝජනය කිරීම සඳහා සංස්ථාවට අවස්ථාව හිමිකර දීම හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙන් බැහැර ස්ථානයක හෝ කිසියම් රටක සම්බන්ධීකරණ කාර්යාල පිහිටුවීම ;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් කිසියම් ස්ථානයක සිටින පරිත්‍යාගශීලීන් විසින් දෙනු ලබන මූල්‍යමය වශයෙන් හෝ ද්‍රව්‍යමය වශයෙන් වූ දීමනා, ත්‍යාග, පරිත්‍යාග, සහනාධාර, පවරාදීම් සහ දායක මුදල් භාර ගැනීම හෝ රැස් කිරීම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ සාධනය කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් පරිත්‍යාග, විවිධ ප්‍රසංග, රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම වෙනත් ක්‍රමවේද තුළින් සුභ පතන්නන් මගින් රැස් කර ගැනීම ;

(ඈ) එම පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට යාමේ දී ඇතිවන අවහිරතා ඉවත් කර ගැනීම සඳහා වගකිව යුතු සාධාරන සහ නීත්‍යානුකූල පියවර ගැනීම ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ ප්‍රවර්ධනය කිරීම කඩිනම් කරනු ලබන කිසියම් නිශ්චල දේපල හෝ කිසියම් අයිතිවාසිකම් හෝ වරප්‍රසාද මිලයට ගැනීම, බද්දට හෝ හුවමාරුවට ගැනීම, කුලියට ගැනීමට හෝ අන්‍යාකාරයකින් අත්පත් කර ගැනීමට සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය වන්නා වූ කිසියම් ගොඩනැගිල්ලක් හෝ තිරවුරක් ඉදි කිරීම, නඩත්තු කිරීම සහ වෙනස් කිරීම ;

(ඊ) චංචල හෝ නිශ්චල දේපල, වාණිජ හෝ කර්මාන්ත ආදියේ කොටස් සහ බැංකු ව්‍යවසාය ඇතුළුව සියලුම ආකාරයේ දේපල ලබා ගැනීම, මිලදී ගැනීම, විකිණීම හෝ අත්පත් කර ගැනීම සහ ඔප්පුවක්, අවසාන කැමති පත්‍රයක් හෝ කොඩිසිල් පත්‍රයක් මගින් පවරනු ලැබූ දේපල භාර ගැනීම ;

(උ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් කිසියම් ස්ථානයක මෙයට සමාන කටයුතු වල නිරත වී ඇති අනෙකුත් තැනැත්තන් හෝ සංවිධාන වලින් සහාය ලබා ගැනීම සහ ඔවුන් හා එක්ව කටයුතු කිරීම ;

(ඌ) සංස්ථාවේ දැක්ම හා පරමාර්ථ අනුගමනය කරනු ලබන ශ්‍රී ලංකාවේ හෝ වෙනත් කිසියම් ස්ථානයක සිටින තැනැත්තන් හෝ සංවිධාන සමග ගිවිසුම්වලට එළඹීම සහ අදාල අනෙකුත් සංවිධාන සමග සම්බන්ධීකරණය පවත්වා ගැනීම සහ අනුබද්ධ වී කටයුතු කිරීම ;

(එ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් කිසියම් ස්ථානයක සිටින කිසියම් තැනැත්තකු රජයක්, සංවිධානයක්, සමාගමක් හෝ ආයතනයක් සමග කිසියම් ගිවිසුමකට එළඹීම හෝ එකඟතාවක් ඇති කර ගැනීම ;

(ඒ) ඕනෑම බැංකුවක හෝ වෙනත් සමාන ආයතනයක ජංගම, ඉතිරිකිරීමේ සහ තැන්පතු ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඔ) වරින් වර නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකට ඇප ඇතිව හෝ නැතිව ඒ කොන්දේසි සහ නියමවලට යටත් ව සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීම ;

(ඕ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කරන ආකාරය පිළිබඳ නිශ්චය කරනු ලබන රීති සහ නියෝග සහ සංස්ථාවේ කටයුතු පවත්වා ගැනීම සහ එම කටයුතුවල විවිධ අංශ පාලනය කිරීම සඳහා අවශ්‍ය සියලුම අනුනීති හෝ ආඥාපනත් සෑදීම, ඉවත් කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම ;

(ක) සංස්ථාවේ අදහස් හා පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන ආනුෂංගික සහ යෝග්‍ය වන එවැනි අනෙකුත් නීත්‍යානුකූල දේ පොදුවේ සිදු කිරීම;

(ග) නීතිය මගින් අවශ්‍ය යැයි හෝ පනවන ලද තත්කාලය සඳහා අදාල විය හැකි වූත් උචිත යැයි සිතිය හැකි වූත් කොන්දේසිවලට යටත්ව සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන සංස්ථාවේ මුදල් ආයෝජනවල, සුරැකුම්පත්වල හෝ දේපලවල ආයෝජනය කිරීම;

(ඝ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙණු කළ හැකි සාධන පත්‍ර හෝ සුරැකුම්පත්‍ර සෑදීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම; සහ

(ඞ) සංස්ථාවේ පරමාර්ථ නිසි පරිදි සහ සාධනීය ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය වන හෝ උපයෝගී වන සියලු වෙනත් ක්‍රියා සිදු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු සාමාජිකයින් පහලොවක් නොඉක්මවන සංඛ්‍යාවකින් සමන්විතවන කළමනාකරණ කමිටුවක් විසින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය. එයට සභාපතිවරයකු, උපසභාපතිවරයකු, පරිපාලන ලේකම්වරයකු, භාණ්ඩාගාරිකයකු සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වූ ඒ කාර්ය ඉටු කිරීම සඳහා එම නිලධරයන් සහ කාර්ය මණ්ඩලයක් සිටිය යුතු ය.

(2) ආරම්භක සාමාජිකයකු වන දයා ධර්මපාල කිලිත්තුව ගමගේ මහතා කළමනාකරණ මණ්ඩලයේ පළමුවැනි සභාපතිවරයා විය යුතු ය. කළමනාකරණ කමිටුවේ ඇති වන කිසියම් පුරප්පාඩුවක් සාමාන්‍ය මණ්ඩලයේ ඊලග රැස්වීම් වාරයේ දී ස්ථිර කිරීමට යටත්ව කමිටුව විසින් ම පිරවිය යුතු ය.

(3) පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ ධුර දරන ලද පදනමේ කළමනාකරණ කමිටුව සංස්ථාවේ පළමුවන කළමනාකරණ කමිටුව බවට පත් විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් මෙහි පහත සඳහන් සියලුම කරුණු හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ රීති, සංස්ථාවේ මහාසභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා ගැනීම, පත් කිරීම හෝ නාම යෝජනා කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ ධුර කාලය;

(ආ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ නියෝජිතයින්ගේ සහ සේවකයින්ගේ කාර්ය සඳහා කර්තව්‍ය මෙහෙයවීම සම්බන්ධ බලතල; සහ

(ඇ) සංස්ථාවේ හෝ කලමනාකරණ කමිටුවේ රැස්වීමක දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය, එම රැස්වීම කැඳවීම සහ පැවැත්වීම මෙන්ම එම රැස්වීම පවත්වනු ලබන වේලාව, ස්ථානය, එම රැස්වීම් පිළිබඳ දැනුම්දීම, එහි න්‍යාය පත්‍රය, ගණපූරණය සහ එම රැස්වීම්වල සාමාන්‍ය කටයුතු මෙහෙයවීම;

(ඈ) සංස්ථාවේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය සඳහා වන සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඉ) සංස්ථාවේ වත්කම් පරිපාලනය, කළමනාකරණය සහ ඒවායේ භාරය සහ එහි අරමුදල් සහ ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය කිරීම;

(ඊ) සංස්ථාවේ සාමාන්‍ය පරිපාලනය සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන ආකාරයටම, එවැනිම රැස්වීමක දී සිදු කළ යුතු වේ.

(3) මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ බලාත්මක වූ සංස්ථාවේ රීති මෙම පනතේ හෝ වෙනත් කිසියම් ලිඛිත නීතියක වන විධිවිධාන හා අනනුකූල නොවන තාක් දුරට මෙම වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති වශයෙන් සැලකිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයන් තත්කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය. එම නීති රීති සාදන ආකාරයටම එවැනිම රැස්වීමක දී වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම සිදු කළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**7.** සංස්ථාවේ මුද්‍රාව, කළමනාකරණ කමිටුවේ යෝජනාවක් මගින් ලබා ගන්නා ලද අධිකාරියක් මත හැර කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. එසේම සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ තත්කාර්ය සඳහා නම් කරන ලද අනෙකුත් සාමාජිකයින් දෙදෙනකුගේ අත්සනින් සත්‍ය බව තහවුරු කරනු ලැබිය යුතු ය.

සංගමය විසින් සහ සංගමයට ගෙවිය යුතු මුදල්.

**8.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වු දිනයෙහි පදනමෙහි පැවති සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට ගෙවිය යුතු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. යම් විදේශීය හෝ දේශීය රාජ්‍ය හෝ පුද්ගලික ආයතන ප්‍රදානය කරනු ලබන හෝ පරිත්‍යාග කරනු ලබන සියලුම මුදල් සහ සංස්ථාවේ කටයුතු කරගෙන යාම සඳහා සංස්ථාව විසින් ලබා ගන්නා සියලුම මුදල් සංස්ථාවේ අරමුදලට බැර විය යුතු ය.

(2) වහාම අවශ්‍ය නොවන සංස්ථාවේ අරමුදල් කිසියම් බැංකුවක හෝ වෙනත් ආයතනයක තැන්පත් කරනු ලැබිය යුතු අතර, එම තැන්පත්වල පොලී මුදල් සංස්ථාවේ කාර්ය සඳහා උපයෝජනය කරනු ලබන ආකාරයට කටයුතු කරනු ලැබිය යුතු ය.

(3) ණය ගැනීම සඳහාත් සංස්ථාවේ හෝ කිසියම් තුන්වන පාර්ශවයක කිසියම් ණය වගකීමක් හෝ බැඳීමක් සඳහා ඇපයක් වශයෙන් යම් දේපලක් හෝ ඉන් කොටසක් පවරා ගැනීම සඳහා අයකිරීම හෝ උකස් කිරීම සඳහාත් සංස්ථාවේ සියලුම බලතල කමිටුව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(4) සංස්ථාවේ කටයුතු සිදු කිරීමේ දී හෝ එහි කාර්ය සහ කර්තව්‍ය කිරීමේ දී සහ ඉටු කිරීමේ දි එහි පරමාර්ථ සහ කාර්ය වැඩිදියුණු කිරීමේ දී සංස්ථාව විසින් දරන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලුම මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(5) සංස්ථාවේ බැංකු ගිණුම හෝ බැංකු ගිණුම් යම් බැංකුවක් හෝ බැංකු සමග පවත්වාගෙන යාම සහ සියලුම චෙක්පත් ලිවීම, අත්සන් කිරීම හෝ පිටසන් කිරීම කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා හෝ උපසභාපතිවරයා හෝ ලේකම්වරයා සහ භාණ්ඩාගාරිකවරයා එක්ව කරනු ලැබිය යුතු ය.

මෙම ඡේදයේ "සභාපතිවරයා" සහ "ලේකම්වරයා" සහ "භාණ්ඩාගාරිකවරයා" යන වචනයට වැඩබලන සභාපතිවරයා, වැඩබලන ලේකම්වරයා හෝ වැඩබලන භාණ්ඩාගාරිකවරයා ඇතුළත් විය යුතු ය.

විගණනය සහ ගිණුම්.

**10.** (1) සංස්ථාව විසින් ස්වකීය ආදායම සහ වියදම, වත්කම් සහ වගකීම් මෙන්ම සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් පොත් ලියාපදිංචි කාර්යාලයේ තැබිය යුතු අතර, සංස්ථාවේ සෑම සාමාජිකයකුටම පරීක්ෂා කිරීම සඳහා විවෘතව තැබිය යුතු ය.

(3) සංස්ථාවේ මහා සභා රැස්වීමක දී නම් කරන ලද සුදුසුකම්ලත් යම් රජයේ විගණකවරයින් විසින් සෑම විගණන වර්ෂයක් සඳහා විගණනය කරන ලද එහි ගිණුම් සංස්ථාව සතුවිය යුතු අතර, සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කරනු ලැබිය යුතු අතර, ඔවුන් පරීක්ෂා කරනු ලැබූ ගිණුම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේම එම වාර්තාවේ පහත කරුණු ඇතුලත් විය යුතු ය :—

(අ) විගණකවරයින්හට අවශ්‍ය සියලුම තොරතුරු සහ විස්තර කිරීම් ඔවුන් විසින් ලබා ගෙන ඇති ද යන බව ;

(ආ) සංස්ථාවේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරන නිරූපණයක් ලැබෙන පරිදි සංස්ථාවේ ගිණුම් මනා ලෙස පවත්වාගෙන ඇති ද යන බව; සහ

(ඇ) කළමනාකරණ මණ්ඩලයේ විගණනය සිදු කිරීමෙන් සහ එහි

අනුමතය ලබා ගැනීමෙන් පසුව ගිණුම් සඳහා නෛතික වලංගුතාවක් ලැබී ඇති ද යන්න.

මේ ඡේදයේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව, සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්, හෝ

අදහස් වේ.

ජනරජයේ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මෙම පනතේ සඳහන් හෝ පනත යටතේ හිමිකම් ප්‍රකාශ කළ හැකි තැනැත්තන් හැර ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අනෙකුත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.